# වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# පොල් වගාකිරීමේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු / 2025

## පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් (වතු) සේවාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### තනතුර : සංචාරක බංගලා සහායක (වතු) PL2

**සේවා ස්ථානය** :- සේවා අවශ්‍යතාවය අනුව දිවයිනපුරා, තනතුරු 08 යි

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද** :

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුය.

සහ

රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් පෙර / අපරදිග කෑම වර්ග පිළියෙළ කිරීම / සංචාරක බංගලා සහායකයකු ලෙස ලබාගත් ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) දෙවන මට්ටමට නොඅඩු සහතිකය සමඟ පිළිගත් ආයතනයක අරක්කැමියෙකු හෝ සංචාරක බංගලා සහායකයකු වශයෙන් ලබා ඇති වසර 02ක පළපුරුද්ද

**වැටුප් කාණ්ඩය** : PL 2

**වැටුප් පරිමාණය** : රු. 42,300/-(490X10)(540X10)(590X10)(630X12) 66,060/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2025 වර්ෂයට | 2026 වර්ෂයට | 2027 වර්ෂයට |
|---|---|---|
| රු.37,715/- | රු.40,008/- | රු.42,300/- |

**දීමනා** : ජීවන වියදම් දීමනාව රු.17,800 ඇතුළු රජයේ අනෙකුත් දීමනා

**වයස** : වයස අවු 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### තනතුර : සංචාරක බංගලා කම්කරු (වතු) PL1

**සේවා ස්ථානය** :- සේවා අවශ්‍යතාවය අනුව දිවයිනපුරා, තනතුරු 06යි.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද** :

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් දෙකක් සහිතව සමත්වී තිබිය යුතුය.

**වැටුප් කාණ්ඩය** : PL 1

**වැටුප් පරිමාණය** : රු. 40,500/-(450X10)(490X10)(540X7)(590X15)(62,530/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2025 වර්ෂයට | 2026 වර්ෂයට | 2027 වර්ෂයට |
|---|---|---|
| රු.36,475/- | රු.38,488/- | රු.40,500/- |

**දීමනා** : ජීවන වියදම් දීමනාව රු.17,800 ඇතුළු රජයේ අනෙකුත් දීමනා

**වයස** : වයස අවු 22 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් කොන්දේසි :-**

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :**

- **ඒ අනුව 2025.07.04 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත වෙබ් අඩවියේ ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකළ යුතුවේ.** එමෙන්ම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සමඟ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේනම් එක තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වේ.
- සියලුම අයදුම්පත් 2025.07.04 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සභාපති,පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**සභාපති,**
**පොල් වගාකිරීමේ මණ්ඩලය,**
**9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**බත්තරමුල්ල.**

ඉහත තනතුරු සඳහා අදාළ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස දන්වමි. එමෙන්ම එසේ බාගත කරගැනීමේ යම් අපහසුතාවයක් ඇති වුවහොත් තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකරන ලෙස දන්වමි.

**https://coconutsrilanka.lk/**